05/10/2010 - ලංකාදීප

**දේශපාලනයට වඩා ප්‍රබල බලවේගයක් - මිලින්ද මොරගොඩ**

අප විසින්ම ඇති කරන ලද ප්‍රශ්නයක්, අපට විසඳා ගන්නට හැකිවන්නේ ප්‍රශ්නය ඇති කරන ලද ආකල්පයන් හි ම පිහිටා ක්‍රියාකිරීමෙන් නොවේ යැයි ඇල්බට් අයිංස්ටයින් මහතා ගේ ප්‍රකට කියමනකි. (We can’t solve problems using the same kind of thinking we used when we created them **- Albert Einstein**) අපට ප්‍රශ්නයක් තිබේ. ඒ දේශපාලනයයි. අප විසින් අපේ පාලනය වෙනුවෙන් බිහිකරගන්නා ලද දේශපාලනය අද රටට බරපතල ප්‍රශ්නයකි. පිළිගත් දේශපාලන පක්ෂ හැටකට වඩා ලියා පදිංචි වී ඇත. ප්‍රාදේශීය, පලාත් හා ජාතික මට්ටමින් දේශපාලනඥයෝ සිටිති. මේ දේශපාලනඥයන් හා පක්ෂ පාර්ලිමේන්තුව නියෝජනය කරති. එයට ඉහලින් විධායක බලය ඇති ජනාධිපති ධුරයක් ද ඇත. එහෙත් මහජනතාව දොස්තබන්නේ දේශපාලනයටයි. දේශපාලනඥයන් තම සාධාරණ ප්‍රශ්න නොවිසඳන බවට පොදු මහජනතාව නගන චෝදනාව තේරුම් ගතහැක්කේ කෙසේද? පවතින දේශපාලන ක්‍රමය සම්බන්ධයෙන් අප විසින්ම ඇති කරන ලද ප්‍රශ්නය අපට විසඳාගන්නට හැකිවන්නේ එය ඇතිකරන ලද අවස්ථාවේ පැවති ආකල්පයන් ගෙන් මිදී ක්‍රියාකිරීමෙන් පමණකි.

ඉතිහාසය දෙස බලනවිට ලෝකය පුරා පැතිරුන දේශපාලනය එකකි. පාලනය අනෙකකි. දේශපාලනය හා පාලනය අතර සම්බන්ධයක් ඇති නමුත් එය පැහැදිලිවම එකිනෙකට වෙනස් අන්ත දෙකකි. ප්‍රජාතන්ත්‍රවාදයට අනුව මහජනතාවට තම අදහස් හා ප්‍රතිපත්ති පැහැදිලි කර මහජන නියෝජිතයන් වශයෙන් පත්වීමට පක්ෂ දේශපාලනය අවශ්‍යය. පාර්ලිමේන්තුව තුළ මහජනතාව විසින් තෝරාගන්නා පක්ෂය හා පක්ෂ නියෝජිතයන් කළ යුත්තේ රාජ්‍ය පාලනයයි. පාලනයේ දී පක්ෂ දේශපාලනයක් තිබිය යුතු නැත. මහජනතාව සිය කැමැත්ත පළකරන්නේ දේශපාලන පක්ෂ සමාජිකයන්ට හෝ අනුගාමිකයන්ට රටේ පාලනය බාරදෙන්නට නොවේ. දේශපාලන පක්ෂයක් පාලනය කරන අන්දමට දේශපාලනඥයන්, රට පාලනය කිරීම සුදුසු නැත. පාලකයන්, දේශපාලන ව්‍යුහයට හාත්පසින්ම වෙනස් රාජ්‍ය තාන්ත්‍රිකයන් සේ ක්‍රියාකිරීම අවශ්‍යය. ඒ සඳහා ප්‍රබල ආකල්ප වෙනසක් අවශ්‍යය.

වර්තමානයේ ශ්‍රී ලංකාවේ දේශපාලනඥයන් හා දේශපාලන පක්ෂ ක්‍රියාකරන්නේ බලය ලබාගැනීමේ උවමනාව අනුවය. ඒ සඳහා දේශපාලන පක්ෂ පිහිටුවාගෙන තිබේ. මෙම පක්ෂ මැතිවරණයක් අවස්ථාවේ ප්‍රතිපත්ති ඉදිරිපත් කරයි. පොරොන්දු දෙයි. මහජනතාව ආකර්ශනය කරගැනීමට කතා කරයි. ජනප්‍රිය වෙන්නට උත්සාහ කරයි. මහජනතාවගේ ඡන්ද වලින් තේරී පත්වූ පසු එය මහජනතාව දුන් බලය සේ සිතයි. ප්‍රතිපත්ති, ගැන කොතරම් කතා කළත් පක්ෂ හා අනුගාමිකයන් අතර ඇත්තේ ගෝත්‍රික සම්බන්ධතාවයකි. බලය ලබා ගැනීම සඳහා මෙම පක්ෂ වශයෙන් සැලකෙන ගෝත්‍රික සමාජය පවත්වාගෙන යයි. එහි අනුගාමික සාමාජිකයෝ දිවි හිමියෙන් පක්ෂය සමග සම්බන්ධ වී තිබේ. මේ නිසා ප්‍රජාතන්ත්‍රවාදයේ නියම ලක්ෂණ අපට හඳුනාගන්නට නොහැකිය. ප්‍රශ්නයක් දෙස බලා එහි ඇත්ත නැත්ත අනුව තීන්දු ගන්නා සහ ඒ අනුව බහුතරයකගේ අදහස මතුවෙන ආකාරයේ ප්‍රජාතන්ත්‍රවාදයක් වෙනුවට පක්ෂය දරන මතයට එකඟවීමේ ක්‍රමය වර්තමානයේ රට තුළ පවතී. සමාජ එකඟතාවයට ප්‍රජාතන්ත්‍රවාදය වැදගත්ය. ගෝත්‍රික ලක්ෂණ වලින් පෙන්වන්නේ යම් ප්‍රමාණයකට අධිපතිවාදී බවකි. මෙම රාමුව තුළ සිදුවන්නේ කෙසේ හෝ බලය ආරක්ෂා කර ගැනීමේ හා මොන උපක්‍රමයකින් හෝ බලය ඩැහැගැනීමේ පක්ෂ විපක්ෂ ගැටුම පමණකි. එයින් පෙනෙන්නේ මෙරට ප්‍රජාතන්ත්‍රවාදයේ පවතින නොදියුණු බවය.

ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් ගැටලු ඇති බව පෙන්වන තවත් පැත්තක් තිබේ. එනම් නිවැරදි සමාජ නියෝජනයක් නොමැති කමයි. අප රටේ කාන්තා ජනගහනය ප්‍රතිශතයක් වශයෙන් වැඩිය. විශ්ව විද්‍යාලයේ ඉගෙන ගන්නා පිරිස අතරින් වැඩි දෙනෙකු සිසුවියන්ය. මැදපෙරදිග ඇතුලු විදේශ රැකියා, ඇගලුම් කර්මාන්තය හා තේ කර්මාන්තය යන ආර්ථිකයේ ප්‍රධාන බලවේග සම්බන්ධයෙන් අවධානය යොමු කළත් කාන්තා දායකත්වය ඉහල ප්‍රතිශතයකි. එනමුත් රට පාලනය කිරීමට, දේශපාලන පක්ෂ නියෝජනයට කාන්තා සහභාගීත්වය ඉතාමත් අල්පය. මෑතක දී ස්විට්සර්ලන්ත කැබිනට් මණ්ඩලයේ කාන්තා නියෝජනය සියයට පණහ ඉක්මවීය. උතුරු යුරෝපයේ එය සම තත්ත්වයකි. දේශපාලනයේ ප්‍රචණ්ඩත්වය, දශක කිහිපයක් තිස්සේ දකුණේ හා උතුරේ පැවති ඝාතන සංස්කෘතිය යන ප්‍රධාන කාරණා ශ්‍රී ලංකාවේ කාන්තාවන් දේශපාලනයට පැමිණීම සීමාකරන්නට තියුණු ලෙස බලපෑවේය. ඉදිරි අවුරුදු පහලොව ඇතුලත වැඩි වයස් ජනගහන ප්‍රතිශතය ඉහල යන බව සංඛ්‍යා

ලේඛන දක්වයි. එවිට මෙම වැඩිහිටි පිරිස, සුලු ජාතීන්ගේ ප්‍රශ්න හා වෙනත් දැවෙන අවස්ථා පාර්ලිමේන්තුවේ  දී නිවැරදිව සාකච්ඡා කරන කණ්ඩායමක් නියෝජනයවීම ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික අවශ්‍යතාවයකි. සමාජයේ හරස්කඩක් නියෝජනය නොවන අවස්ථාවක එය ප්‍රජාතන්ත්‍රවාදය හා නියම මහජන මතය වශයෙන් සැලකිය හැකිද?

බලය ලබා ගැනීම නොඑසේනම් බලයට පත්වීම අද මේ රටේ දේශපාලනයේ භාවිතා වන අදහස්ය. ප්‍රජාතන්ත්‍රවාදය හඳුන්වා දුන් මුල් යුගයේ මහජන නියෝජිතයන් තේරී පත්වන්නේ මහජනතාවගේ සේවකයන් ලෙස මහජනතාවට සේවය සලසන්නටය. ක්‍රමයෙන් මේ ආකල්පය වෙනස් වී බලය ට පත්වීම දක්වා විකාශය වී තිබේ. ආර්ථික හා සමාජයීය වශයෙන් දුප්පත් රටවල මහජනතාව තමන්ගෙන් බලය ලබාගන්නා නියෝජිතයන් මේ බලය සමාජ යහපතට යොදවනු ඇතැයි අපේක්ෂා කරයි. එනමුත් බලයට පත්වන නියෝජිතයන් ගේ උත්සාහය බලය ආරක්ෂා කර ගැනීමය. බලයෙන් පහ වී සිටින විපක්ෂ දේශපාලනඥයන් උත්සාහ කරන්නේ විවිධ චෝදනා, ගැරහීම් හා කුමන්ත්‍රණ අවසානයේ බලයේ සිටින කණ්ඩායම පලවා තමන්ට බලය ලබා ගැනීමටය. මෙම බල අරගලය හෙයින් මහජනතාවට ලැබී ඇත්තේ කවර අවස්ථාවක්ද?

ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය තුළ බලය තිබිය යුත්තේ මහජනතාව සතුවය. යම් කාලසීමාවකට ඔවුන් තම බලය මහජන නියෝජිතයන්ට පවරයි. එවිට ඔවුන් සාධාරණ හා යුක්තිගරුක අන්දමට රට පාලනයට එකී බලය පාවිච්චි කළ යුතුය. එක පැත්තකින්,  බලය ලබා ගන්නා වර්තමාන දේශපාලනඥයන් ස්වකීය බලය පාවිච්චි කරන්නේ නැත. එයට හේතුව දේශපාලනයයි. මීළඟ ඡන්දය, තම ජනප්‍රියතාවය ගැන සිතන මහජන සේවය උදෙසා බලයට පත්වූ දේශපාලනඥයන් හා දේශපාලන පක්ෂ අවශ්‍ය තැන නිසි තීන්දු ගැනීමට මැළිවෙති. ආර්ථික සාමාජයීය අවශ්‍යතා වලදී තීන්දු ගන්නේ මීළඟ මැතිවරණය ගැන සිතමින්ය. එයින් රටට යහපතක් නොවේ. ආණ්ඩු බලය ලබා ගන්නා පක්ෂය දේශපාලනය වෙනුවට රාජ්‍ය පාලනය කළ යුතුය. අවශ්‍ය තීන්දු ගෙන රට ඉදිරියට ගෙන යා යුතුය. නිවැරදි තීන්දු ඉදිරියේ විපක්ෂය සහාය දිය යුතු අතර වැරදි තීරණ ගන්නා අවස්ථාවේ එය නිවැරදි කරන්නට කරුණු පෙන්වා දිය යුතුය. එනමුත් ප්‍රජාතන්ත්‍රවාදයේ මෙවැනි වටිනාකම් අප සැලකිල්ලට ගන්නේ නැත.

දැනට ලෝකයේ පවතින සම්ප්‍රදායික ප්‍රජාතන්ත්‍රවාදය අනුව විධායක ජනාධිපති ක්‍රමයේ දී අමාත්‍ය මණ්ඩලය තෝරා ගන්නේ මහජන ඡන්දයෙන් නොවේ. පාර්ලිමේන්තුවේ සිටින්නේ මහජන නියෝජිතයන් වන මන්ත්‍රීවරුය. බුද්ධිමත්, සමාජය ගරු කරන, රට ඉදිරියට ගෙන යා හැකි තමන්ට විශ්වාසවන්ත කණ්ඩායමක් තම කැබිනට් මණ්ඩලය වශයෙන් ඡන්දයෙන් පත්වන විධායක ජනාධිපති වරයා තෝරා ගන්නේ පාර්ලිමේන්තුවට පිටතින්ය. ඇමරිකාවේ විධායක ජනාධිපති ක්‍රමය එයයි. සෙනෙට් මණ්ඩලය වසර හයක දිග කාලයක් වෙනුවෙන් දුර බලන ප්‍රතිපත්ති සම්පාදක කණ්ඩායමකි. කොන්ග්‍රස් මණ්ඩලය වසර දෙකක නිල කාලයක් තුළ කෙටි කාලීන ප්‍රශ්න දෙස බලමින් ක්‍රියාකරන බව සංකල්පයයි. විධායක ජනාධිපති සිව් වසරකට පත්ව මෙම කොන්ග්‍රස් හා සෙනෙට් මණ්ඩල අතර සිටිමින් ප්‍රජාතන්ත්‍රවාදය සමබර කරයි. ප්‍රංශ විධායක ක්‍රමය අනුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ඇමති මණ්ඩලයට ඇතුල් වුවහොත් ඔහු හෝ ඇය පාර්ලිමේන්තු මහජන නියෝජිත ධුරයෙන් ඉවත්විය යුතුය. උතුරු යුරෝපයේ වුවත් ඇමති මණ්ඩලය පාර්ලිමේන්තුව නියෝජනය කරන නමුත් ඡන්දය පාවිච්චි කළ කොහැක. එවැනි සම්ප්‍රදායක් ඇතිකිරීමෙන් දේශපාලනය හා රට පාලනය අතර පැහැදිලි වෙනස පෙන්වයි. ඇමතිවරු කරන්නේ දේශපාලනය නොවේ. ඔවුහු තම දැනුම හා ජාත්‍යන්තරයේ සිදුවන වෙනස්කම් හදාරා රටට ගැලපෙන වෙනස්කම් ස්වකීය අමාත්‍යංශ හරහා සිදුකරති. බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ ඇමතිවරු දේශපාලනය කරන්නේ ප්‍රතිපත්ති අනුවය. පක්ෂයේ ප්‍රතිපත්ති අනුව අමාත්‍යංශය මෙහෙයවිය යුතු ආකාරය නිලධාරීන්ට පෙන්වා දෙයි. එදිනෙදා අමාත්‍යංශ පාලන කටයුතු වලට මැදිහත් නොවන අතර අමාත්‍යංශයේ දේශපාලනය කරන්නේ නැත. තම ඡන්ද දායකයන් හමුවීමක්, ඔවුන්ගේ ගැටලු විසඳීමක් නොකරන නිසා අමාත්‍යංශය දේශපාලන පක්ෂ කාර්යාලයක් බවට පත්වන්නේ ද නැත. මහජනතාව හමුවීම සඳහා තම ආසනයේ කාර්යාලයේ නිශ්චිත දිනයක් ඇති අතර ඒ දිනයේ දී මහජනතාව හමුවී ඔවුන්ගේ ගැටලු නිරාකරණය කරයි. ව්‍යවස්ථාවක් නැති බ්‍රිතාන්‍යයේ පාර්ලිමේන්තුවේ මේ දේශපාලනය හා පාලනය අතර සම්බන්ධතාවය ක්‍රියාත්මක වන්නේ සම්ප්‍රදාය අනුවය. දියුණුවෙමින් පවතින ඉන්දියාවේ පවා පක්ෂ දේශපාලනයට නතු නොවූ පාලනයක් පවත්වාගෙන යන්නට සමත්ව තිබේ.

ශ්‍රී ලංකාවේ විධායක ක්‍රමය අනුව මහජන නියෝජිතයන් ඇමති මණ්ඩලයට තෝරා ගැනෙති. ඔවුන් දේශපාලනය කර අතර මහජනතාව මෙම දේශපාලනය කරන ඇමතිවරුන්ගෙන් රට පාලනයවනු ඇතැයි අපේක්ෂා කරති. එපමණක් ද නොවේ. දේශපාලන අනුගාමිකයන් වශයෙන් ඇමතිවරු හමුවී දේශපාලන බලපෑම් බලාපොරොත්තු වන අතර එය ඉටු නොවෙන විට අපේක්ෂා භංගත්වයට පත්ව ඇමතිවරු දෝෂ දර්ශනයට ලක්කරති. මැතිවරණය අවස්ථාවේ තමන්ගේ වීරයන් වූ මැති ඇමතිවරු වැඩි කළක් යන්නට කලින් දූෂිතයන්, වංචාකාරයින් හා රට විනාශ කරන පුද්ගලයින් ලෙස චෝදනා ලබයි. පාක්ෂිකයන්ට වැඩි හිතවත්කමක් දක්වන හෙයින් යළි යළිත් ගෝත්‍රික ලක්ෂණ තහවුරුවෙයි. පාලකයින් ලෙස ක්‍රියා නොකරන හෙයින් පොදු මහජනතාවගේ විශ්වාසය බිඳ වැටෙයි.

පසුගිය අවුරුදු තිහ ඇතුලත මේ රට පැවතියේ යුධ සංස්කෘතියකය. මේ යුද පරිසරය තුළ රටට අවශ්‍යව තිබුණේ ආණ්ඩුවට බලය දී ත්‍රස්තවාදය විනාශ කිරීමේ අවශ්‍යතාවයයි. මහජනතාව එය අපේක්ෂා කළේය. එපමණක් නොවේ. මහජනතාව නායකයින් වෙත තමන් සතු සම්පූර්ණ බලය පවරන්නට තීන්දු කළේය. දැන් සාමකාමී අවස්ථාව උදා වී තිබේ. මහජනතාව විසින් පවරා දුන් බලය ආපසු ගන්නා ආකාරය ව්‍යවස්ථාවේ නැත. එවැනි සම්ප්‍රදායක් ද මේ රටට නැත. පාලන තන්ත්‍රය හා ජනතාවගේ හැසිරීම අනුව රටවල් ගොඩනැගෙන්නේ ව්‍යවස්ථා හෝ එහි අඩංගු වගන්ති අනුව නොවේ. ඒ වගන්ති වලට රට පාලනය කළ හැකි නම් ලෝකයේ හොඳම නීති රීති හා පාලන රාමුව අපට ඇත. රටක් ගොඩනගන්නට නම් සම්ප්‍රදායයක් බිහි කළ යුතුය. අලුත් ආකාරයට හිතන, අලුත් බලවේග වලට ඉඩ දෙන සම්ප්‍රදායයන් මගින් රට පුනර්ජීවනයකට ලක්වෙයි. එයින් මහජනතාවගේ අවශ්‍යතා ඉටුවෙයි. දේශපාලනයට එපිටින් ඇති රට පාලනය කරන දර්ශනය ගොඩ නැගේ. ඒ සඳහා ශක්තිය ඇති දැක්මක් ඇති නියෝජනයක් පාර්ලිමේන්තුව හා පලාත් පාලන ආයතන වල තිබිය යුතුය. කාන්තාවන්, බුද්ධිමතුන් හා සිවිල් සංවිධාන නායකයින් එහි නියෝජනය වුවහොත් පොදුජනතාවගේ අවශ්‍යතා, ගැටලු ගැන නිවැරදි දැක්මක් ඇතිකර ගැනීම පහසුය. පාක්ෂිකයන් නොව සමස්ථ රටවැසියන් ගැන සිතන පරිසරයක් ගොඩ නැගිය හැකිය.

ඒ සමග පාලකයන්ගේ භූමිකාව ද වඩා පුලුල් වනු ඇත. යුද්ධයක දී ත්‍රස්තවාදය මඩින්නට තීන්දු ගත්තේ මහජනතාවගෙන් විමසා, ආණ්ඩුවේ සියලුම කොටස් කරුවන්ගේ අදහස් අනුව නොවේ. ආර්ථික හා සමාජ ප්‍රශ්න විසඳීමේ දී ද රට පාලනය විය යුත්තේ එසේය. මහජනතාව පාලකයන් හට පාලන බලය දී ඇත්තේ රට ගොඩනගන තීන්දු ගැනීම උදෙසාය. ත්‍රස්තවාදයෙන් පසු ආර්ථිකය, අධ්‍යාපනය, සොඛ්‍ය, ප්‍රවාහනය හෝ පරිසරය වැනි කවර අංශයක වේවා පුනර්ජීවනයක් මහජනතාව අපේක්ෂා කරයි. එය දේශපාලන ගෝත්‍ර අනුව දියත්වන එකක් නොවේ. පුලුල් ලෙස සිතා පාලකයන් වශයෙන් ගන්නා තීන්දු හැටියටය. ආණ්ඩු බලය ලබා ගැනීමෙන් පසු මහජන හිත සුව පිණිස එසේ තීන්දු ගැනීම වැරදි බවට ප්‍රති පාක්ෂික දේශපාලන පක්ෂ චෝදනා කරනු ඇත. එනමුත් එය දැකිය යුත්තේ සමාජයේ කුඩාම ඒකකය වන නිවසක සිදුවන තීන්දු ගැනීමකට සමානවය. දෙමව්පියන් දරුවන්ගේ යහපත වෙනුවෙන් ගන්නා තීරණ හැම විටම ප්‍රජාතන්ත්‍රවාදී නැත. දරුවන්ගෙන් විමසා ඔවුන්ගේ කැමැත්ත අනුව ම පවුලේ අවශ්‍ය දේ සිදුනොවේ. එනමුත් ඒ තීන්දු ක්‍රියාවට නැගී එහි ප්‍රතිපල දැනෙන විට පවුලේ සමගිය හා සමෘද්ධිය ලඟා වන බව තේරුම් ගත යුතුය. නිවැරදි සමාජ නියෝජනය ඇති විට මෙවැනි අවිශ්වාසය දුරුවෙයි. දේශපාලන චෝදනා අඩු වෙයි. තීන්දු නොගෙන, පාලනය වෙනුවට දේශපාලනය කරගෙන යමින් ඉදිරියට ගියහොත් තවත් කෙටි කාලයක් ඇතුලත තමන් අපේක්ෂා කළ පාලනය පාලකයන්ගෙන් නොලැබෙන බව මහජනතාව තේරුම් ගනී. දේශපාලනය විසින් කොතරම් දැඩි බැම් බැඳ දේශපාලන බලහත්කාරයෙන් එය පවත්වාගෙන යන්නට උත්සාහ කළත් අවසානයේ එය පුපුරා යයි. මේ පුපුරා යාම සමාජ විප්ලවයකි. පසුගිය කෙටි ඉතිහාසය ඇතුලත එවැනි අවස්ථා ලාංකික සමාජයේ සිදුවූ අවස්ථා ගණනාවකි. පරම්පරා තුනක රුධිරය ඒ වෙනුවෙන් වන්දි ගෙවූ අතර රටට අහිමි වූයේ ධෛර්යය සම්පන්න කකියන රුධිරයයි.

පාලකයන්ගෙන් අපේක්ෂා කරන යුක්තිය සාධාරණත්වය හා සමාන අවස්ථා නොලැබෙන විට එයට එරෙහිව විරෝධය මතු වෙයි. අලුත් සමාජයක් තුළ ඉවසිල්ලෙන් හා යුක්ති සහගත ලෙස රට පාලනය කරන්නට අප සූදානම් ද? එසේ නැතිනම් තව දුරටත් පක්ෂ දේශපාලනය හා දේශපාලන උපාය පවත්වාගෙන යමින් රටේ බලය ඩැහැගැනීමේ නිරන්තර අරගලය තවදුරටත් එලෙසම පවත්වාගෙන යාමට ඉඩ

දෙනවාද? බුද්ධිමතුන් සමාජ විපර්යාසකයින්,පුද්ගලික අංශය හා සිවිල් සංවිධාන නායකයින් මේ ගැන ගැඹුරු කතිකාවතක යෙදීම වැදගත්ය.

රාජ්‍ය පාලනය වෙනුවෙන් යහපත් චින්තකයින්, සමාජ නායකයින් හා දාර්ශනිකයන් අවශ්‍යය. ඔවුහු රටට අවශ්‍ය පෙරදැක්ම ඇතිව ක්‍රියා කරනු ඇත. එනමුත් අද ජනතාව අතරත් දේශපාලන පක්ෂ අතරත් ලාබ සංකල්පයක් ප්‍රචලිත වෙමින් තිබේ. මහත්මා දේශපාලනය රටට වැඩක් නැති බවට පළවෙන අදහස එයින් එකකි. දේශපාලනයට යහපත් මිනිසුන් නොගැලපෙන අතර මොන ක්‍රමයකින් හෝ පාක්ෂිකයන් ආරක්ෂා කරගන්නට නොදන්නා හා බලය ලබා ගැනීමට ඕනෑම දෙයක්කළ නොහැකි පුද්ගලයන්ට ජනතා පිළිගැනීමක් නැති බව ප්‍රසිද්ධියේ ප්‍රකාශවෙයි. දේශපාලනයට අවතීර්ණ විය යුත්තේ ලජ්ජාව, බිය හා ගරුත්වය ට හානි කරගත් පිරිසක් පමණක්ය යන්න එහි අරුතයි. මෙවැනි වහා ඉවතට හල යුතු හානිකර අදහසක් මතුවෙන්නට ඉඩදීම සාහසිකත්වයකි. රටේ නායකයින් හා මහජනතාවගේ නියෝජිතයන් විය යුතු එවැනි පිරිසක්ද? පවතින ක්‍රමය හා ව්‍යවස්ථාව විසින් නිර්මාණය කර ඇත්තේ එවැනි පිරිසකට පමණක් ඉඩ දෙන දේශපාලන රාමුවක්ද? නායකත්වය යනු පරිභව කරමින් අනුන් හෙලා දකින, ඝෝෂාවෙන් අන්‍ය මතය යටපත් කර ගන්නට තැත්කරන අය නොවේ. සන්සුන්ව මැදගත් සිතින් සියලු අදහස් විමසා දුරදක්නා නුවනින් යුතුව තීන්දු ගන්නා පිරිසක් මහජන නායකයින් විය යුතුය. තම නියෝජිතයා ජනප්‍රිය අයෙකු ද නැතිනම් මහජනතාවගේ ගරුත්වය දිනාගත හැකි අයෙකු ද යන තීන්දුව දේශපාලන පක්ෂ නායකයින් ගත යුතු මොහොත උදා වී තිබේ.

සාමය උදා වී රට එකමුතු කරමින් නව අනන්‍යතාවයක් අනුව රට ගොඩ නගමින් සිටින වකවානුවේ රටට අවශ්‍යව ඇති මෙකී නව ආකල්ප අප විසින් වගා කළ යුතුය. ව්‍යවස්ථා වෙනස් කරමින් රටේ ඉදිරි ගමන ගැන අවධානය යොමු කරනවා හා සමානව ම මෙවැනි සම්ප්‍රදාය ඇති කිරීම මගින් නීතියෙන් කළ නොහැකි සද්‍යුගයක් බිහි කරන්නට පදනම දැමිය හැකිය. මැතිවරණ සමයේ මහජනතාව හමුවට ගොස් දේශපාලනය කරන, මැතිවරණයෙන් ඉනික්බිති පාක්ෂික සංකල්ප පසෙක ලා පාලනය කෙරෙහි වෙහෙසෙන හා මහජන සේවය වෙනුවෙන් කැපවී ක්‍රියා කරන ජාතික නායකයින් අප බිහිකර ගත යුතුය. ප්‍රාදේශීය සභා හා නගර සභා පාලනයට සම්බන්ධ විය යුත්තේ ඒ ප්‍රදේශවල සිටින සමාජය ගරු කරන පුද්ගලයින්ය. දේශපාලනය

වෘත්තියක් නොව සේවයක් සේ සලකා අර්ධකාලීනව ප්‍රාදේශීය පාලනයට සම්බන්ධවන මෙම පිරිසගෙන් පොදු අරමුණකට අනුව තම බල ප්‍රදේශයේ අවශ්‍යතා හොඳින් සොයා බලා වැඩ කරන කණ්ඩායමක් බිහිවෙයි.

මේ වෙනස ඇතිකරන්නට ආගමික නායකයන්ට, අධිකරණයට, පුද්ගලික අංශයට, ජනමාධ්‍යයට, හා සිවිල් සංවිධාන ක්‍රියාධරයන්ට සුවිශේෂී වගකීමක් ඇත. යුධමය පරිසරය තුළ ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික සංස්කෘතික අනන්‍යතාවය විනාශ විය. අපට ඉතිහාසයක් තිබිණ. ආගමික නායකයන්ට ගරු කළේය. අවවාද අනුශාසනා පිළිගත්තේය. දරුවන්, දෙමව්පියන්ටත් වැඩිහිටියන්ටත් වැඳ ගරු බුහුමන් දැක්වූයේය. ඒ සම්ප්‍රදායික වතාවත් අපෙන් ඈත් වී තිබේ. මේ නිසා සමාජ විනය පිරිහී ඇත. මිනිසුන් එකිනෙකා නොහඳුනන්නේත්, ගරු කළ යුතු තැන, ගරු කළ යුතු ආයතනය හා ගරු කළ යුතු පුද්ගලයා නිගරු වන අන්දමට ක්‍රියා කරන්නේ මේ සම්ප්‍රදායික පදනම දෙදරන ලද අවස්ථාවේ දීය. ආගමික සංවිධාන, සිවිල් සංවිධාන හා ජනමාධ්‍ය පිරිහී ඇතැයි ද මුදලට යටවී දේශපාලණීකරණය වී ඇතැයි ද චෝදනා ලබන්නේ මේ නිසාය. මෙම සියලු ආයතන යළි මහජන විශ්වාසය ඇති ගෞරවණීය ආයතන විය යුතුය. රටේ දේශපාලනය පිරිහී ඇතැයි දොස් තබන අතරවාරයේ අලුතින් සිතන යුගයක් කෙරෙහි බලාපොරොත්තු දල්වා ගැනීම වැදගත්ය. හරයක් නැති අවස්ථා ඉහලින් තබන අවස්ථා අවබෝධ කර ගත යුතුය. වැඩිහිටියන්ට, ඔවුන්ගේ අත්දැකීම් වලට ගරුකරන, ජ්‍යේශ්ඨත්වය හඳුනන සමාජ නායකයින්ගේ මත වලට ගරු කරමින් ඒවා සංවාදයට ලක්කරන සමාජ සම්ප්‍රදායක් රටට අවශ්‍යය.

පවතින සමාජ බෙදීම් තහවුරු කරමින් දේශපාලන පක්ෂ ගෝත්‍රික ක්‍රම තවදුරටත් ගෙන යන්නට අනුබල දුන්නොත් ඉදිරියේදී එම බෙදීම් තවත් වැඩිවනු ඇත. දේශපාලනයට වඩා පාලනය ගැනත්, බෙදුන රට එකතු කරන හා පවතින විෂම සංස්කෘතිය වෙනස් කරන්නට උනන්දු කරන සමාජ බලවේගයක් අද අවශ්‍යය.